**05-03-2026 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, පරමාත්ම පියා දැනුමැති දරුවන්ට ආදරෙයි. එබැවින් පියා හා සමානව, අධිපති දැනුමේ මහා සාගර වන්න.

**ප්‍රශ්නය:** මෙම හිතකාමී යුගයෙදී, පරම පියා ඔය දරුවන්ට සිහි කරවන්නේ මොනවාද?

**පිළිතුර:** දරුවනි, ඔබ ඔබගේ නිවහනින් පිට වී, දැනට වසර 5000 ක් ගෙවී ගිහින්. වසර 5000 කදී ඔබ උපත් 84 ක් ගෙන ඇති අතර, මෙය ඔබගේ අවසන් උපතයි එය ඔබගේ විශ්‍රාමික අවදියයි. එබැවින් දැන් ආපසු නිවසට යාමට සූදානම් වන්න. එවිට ඔබ සතුටේ දේශයට යයි. ඔබගේ පවුලේ අය සමඟ ඔබට ඔබගේ නිවසේ වාසය කළ හැක, නමුත් මෙම අවසන් උපතෙදී පිවිතුරු වී, පරම පියා සිහිපත් කරන්න.

**ගීතය:** සලබයන් වෙනුවෙන් සමූහය තුළ පහන දැල් වී ඇත.

ඕම් ශාන්ති. දෙවියන් එක් අයෙක් බව ඔය දරුවන්ට වැටහී ඇත. පරමාත්ම දෙවියන් එක් අයෙකි. සියලුම ජීවාත්මයන්ගේ පියා, එක් කෙනෙක්ය. ඔහුට උත්තරීතර පියා, උත්තරීතර ජීවාත්මය යැයි කියයි. ලෝකයේ නිර්මාණකරු, එක් අයෙකි බොහෝ දෙනෙක් සිටිය නොහැක. මෙම න්‍යායට අනුව, තමන් දෙවියන් කියා මනුෂ්‍යයන්ට කිව නොහැක. ඔබ දැන් දේවමය සේවය සඳහා උපකරණ වී ඇත. ස්වර්ණමය යුගය ලෙසින් හැඳින්වෙන නව ලෝකය, පරමාත්ම දෙවියන් ස්ථාපිත කරනවා. ඔබ එයට සුදුස්සන් වනවා. ස්වර්ණමය යුගයේ කිසිම කෙනෙක් අපවිත්‍ර නැත. ඔබ දැන් පිවිතුරු වෙමින් සිටනවා. ඔහු පවසන්නේ මම, පාරිශුද්ධකරු වන අතර, මා ඔය දරුවන්ට උසස් උපදෙස් ලබා දෙමි අශාරීරික පියා වන මා සිහි කරන්න, එවිට ඔබ අපවිත්‍ර සහ තමෝප්‍රධාන් බවින් පිවිතුරු සහ සතෝප්‍රධාන් වෙයි. සිහිපත් කිරීමේ යෝගා ගින්නෙන් ඔබගේ පාපයන් දුරු වී යාවි. දෙවියන් සෑම තැනකම සිටින බව, පැවිද්දන් සහ පූජකයන් කියයි. එක් අතකින් දෙවියන් එක් අයෙක් බව ඔවුන් පවසන අතර, අනෙක් අතට, මෙහි (මෙම ලෝකයේ) තමන් දෙවියන් බව කියා ගන්නා බොහෝ දෙනෙක් සිටියි. ඔවුන් තමන්ව 'ශ්‍රී ශ්‍රී ජගත්ගුරු 108' ලෙසින් හඳුන්වයි. ලෝකයේ ගුරු, එක් පරම පියා පමණයි. මුළු ලෝකයම පාරිශුද්ධත්වයට පත් කරන, උත්තරීතර ජීවාත්මය, මුළු ලෝකයම දුකින් මුදවාගනී. සතුට පිරිනමන්නා සහ දුක නැති කරන්නා ඔහු පමණයි. මනුෂ්‍යයන්ව එසේ හැඳින්විය නොහැක. මෙය වැටහෙන්නේ ඔය දරුවන්ට පමණයි. මෙය අපවිත්‍ර ලෝකය වන අතර සියලු දෙනාම අපවිත්‍රයි. පිවිතුරු ලෝකයේ අධිරාජයා සහ අධිරාජිණිය කෙබඳුද, පුරවැසියන්ද එසේය. ස්වර්ණමය යුගයේ, ඔවුන් පිදුම් ලබන්නට සුදුසු අධිරාජවරුන් සහ අධිරාජිණියන්ය. පසුව භක්ති මාර්ගයේදී, ඔවුන් වඳින්නන් බවට පත් වෙයි. ස්වර්ණමය යුගයේ අධිරාජයා සහ අධිරාජිණියගේ අංශක දෙකක් අඩු වූ විට, ඔවුන්ට රජ සහ රැජින යැයි කියයි. මේ සියල්ලම විස්තරාත්මක කාරණාය. එසේ නැතහොත් ජීවන-මුක්තිය තත්පරයකදී ලැබෙයි. පරම පියා විස්තර කරන්නේ ඔබගේ පවුලේ අය සමඟ ඔබට නිවසේ වාසය කළ හැක, නමුත් මෙම අවසන් උපතෙදී, පිවිතුරුව සිටින්න. එය දැන් ඔබගේ විශ්‍රාමික ස්ථිතියයි. විශ්‍රාමික දේශය සහ සාම දේශය එකයි. එහි බ්‍රහ්ම තත්ත්වයේ, ජීවාත්ම වාසය කරන අතර එයට බ්‍රහ්මාන්ඩ් යැයිද කියයි. ඇත්ත වශයෙන්ම ජීවාත්ම බිත්තරයක හැඩයක් ගන්නේ නැත. ජීවයක් තරුවකි. මෙම නාටකයේ සියලු ජීවාත්ම, නළුවන් බව බාබා විස්තර කර ඇත. නාට්‍යයක නළුවන්, ඔවුන්ගේ විවිධ චරිත කොටස් රඟපාන විට, ඔවුන් විවිධ ඇඳුම් වලට මාරු වන අන්දමින්ම, මෙයත් අසීමිත නාට්‍යයකි. ආරම්භයේ සිට ජීවාත්ම, පොළෝ තලයට පැමිණ, පංච මහා භූතයන්ගෙන් සෑදී සිරුරු වලට ඇතුළු වී, ඔවුන්ගේ චරිත කොටස් රඟපායි. උත්තරීතර ජීවය මෙන්ම බ්‍රහ්ම, විෂ්ණු සහ ශංකර් යන සියල්ලන්ම නළුවන්ය. නාටකයක, ඔබගේ චරිත කොටස් රඟපෑම සඳහා, ඔබට විවිධ ඇඳුම් ලබා දෙයි. නිවසෙදී, සියලුම ජීවාත්ම සිටින්නේ සිරුරු නොමැතිවයි. පසුව පංච මහා භූතයන්ගෙන් සෑදි සිරුරක් සූදානම් වූ විට, එය තුළට ජීවාත්මයක් ඇතුළු වෙයි. ජීවාත්මයකට සිරුරු 84 ක් ලැබෙන අතර එබැවින් ඔහුට එපමණ නම්ද ලැබෙයි. ජීවාත්මයට තිබෙන්නේ එක් නමයි. පාරිශුද්ධකරු වන්නේ ශිවබාබාය. ඔහුගේම සිරුරක් ඔහුට නැත. ඔහු සිරුරක ආධාරය ගත යුතුයි. ඔහු පවසන්නේ මගේ නම, ශිවාය. මම පැරණි සිරුරකට ඇතුළු වන නමුත්, මෙම කෙනාගේ සිරුරේ නම අයත් වන්නේ ඔහුටයි. ඔහුට ලෞකික නමක් තිබෙන අතර ඉන්පසුව ඔහුට ආධ්‍යාත්මික නමක් දෙනු ලබයි. කෙනෙක් එක් ආගමකින් තව ආගමකට හැරෙන විට, ඔහුගේ නම වෙනස් වෙයි. ඔබද ශුද්‍ර ආගමෙන් වෙනස් වී, බ්‍රහ්මිණ් ආගමට පැමිණ ඇති බැවින්,

ඔබගේ නම් වෙනස් වෙයි. ඔබ ලියන්නේ බ්‍රහ්ම මාර්ගයෙන් ශිව බාබා. උත්තරීතර පියා, උත්තරීතර ජීවාත්මය, ශිව බාබාය. ඔහුගේ නම වෙනස් වන්නේ නැත. ප්‍රජාපිතා බ්‍රහ්මගේ මාර්ගයෙන්, ශිව බාබා, දැන් අතුරුදහන්ව ගොස් ඇති ආදි සනාතන දෙවි දේවතා ධර්මයේ ස්ථාපනය සිදු කරනවා. පිවිතුරු සහ පිදුම් ලබන්නට සුදුසුව සිටි අය, අපවිත්‍ර සහ වඳින්නන් බවට පත් වී ඇත. ඔබ උපත් 84 ක් සම්පූර්ණ කර ඇත. දැන් නැවත වරක් දේවතා ධර්මය ස්ථාපිත කෙරෙනවා. උත්තරීතර පියා, උත්තරීතර ජීවාත්මය පැමිණ, නැවත වතාවක් බ්‍රහ්මගේ මාර්ගයෙන් ස්ථාපනය සිදු කරන බව, සිහි කර ඇත. එබැවින් අනිවාර්යයෙන්ම බ්‍රහ්මණයන් අවශ්‍යයි. බ්‍රහ්ම සහ බ්‍රහ්මණයන් පැමිණෙන්නේ කොහේ සිටද? ශිව බාබා පැමිණ, ඔබව බ්‍රහ්මගේ මාර්ගයෙන් දරුකමට හදාගන්නවා. ඔහු පවසන්නේ ඔබ අයත් වන්නේ මටයි. ඔබ කොහොමත් ශිව බාබාගේ දරුවන් වන අතර, ඉන්පසුව, බ්‍රහ්මගේ මාර්ගයෙන් ඔබ මුනුපුරන් වනවා. සියලුම මනුෂ්‍යයන්ගේ පියා එක්කෙනෙකි. මෙම දරුවන් සියල්ලම කුමාරීන් සහ කුමාරයන්ය. ශිව බාබා, ඔවුන්ව බ්‍රහ්මගේ මාර්ගයෙන් දරුකමට හදාගනී. පරම පියා පැමිණ, ආදි සනාතන දෙවි දේවතා ධර්මය ස්ථාපිත කරන බව මිනිසුන් නොදනී. අළුත් ජීවාත්ම පැමිණෙනවා නොවෙයි. සියලු දෙනාම ශූන්‍ය වී, ඉන්පසුව ක්‍රිෂ්ණා, මහා සයුරේ බෝ පත්‍රයක පාවී ආ බව, ඔවුන් පෙන්වයි. ඔවුන් ඒ සියලුම කතා ගොතා ඇත. ලෝකයේ ඉතිහාසය සහ භූගෝලය අඛණ්ඩව නැවත නැවතත් ඒ අන්දමින්ම සිදුවෙයි. ජීවාත්මයක් අමරණීය වන අතර සෑම ජීවාත්මයකම ඇති චරිත කොටස සදාතනිකයි චරිත කොටස කිසිදා මැකෙන්නේ නැත. ස්වර්ණමය යුගයේ ලක්ෂ්මි සහ නාරායනගේ සූර්ය රජ පෙළපත් රාජධානිය තිබේ එය කිසිදා වෙනස් වන්නේ නැත. ලෝකය අඛණ්ඩව අළුත් සිට පැරණි සහ පැරණි සිට අළුත් බවට පරිවර්ථනය වෙයි. සෑම කෙනෙකුටම තමන්ගේ අවිනාශී චරිත කොටස ලැබී තිබේ. පරම පියා පවසන්නේ භක්ති මාර්ගයේ, බැතිමතුන් කුමන ආකාරයේ හැඟීම් ඇතිව ඔවුන්ගේ වන්දනාමාන කරන්නේද, මා ඒ අනුව ඔවුන්ට දර්ශන ලබා දෙමි. මා ඇතමුන්ට හනුමාන්ගේ දර්ශනයක්ද තවත් සමහරෙකුට ගණදෙවියන්ගේ දර්ශනයක්ද ලබා දෙන්නෙමි. මම ඔවුන්ගේ භක්තියේ හැඟීම් ඉටු කරන්නෙමි. මෙයත් නාටකයේ නියම වී තිබේ. දෙවියන්, සෑම කෙනෙක් තුළම සිටින බව, එවිට මිනිසුන් සිතයි. ඔහු සර්ව ව්‍යාප්ත බව ඔවුන් පවසන්නේ ඒ නිසාය. බැතිමතුන්ගේ මාලාවක් තිබේ. පිරිමින් අතර ප්‍රධාන කෙනා, නාරද යැයිද, ස්ත්‍රීන් අතර මීරා බවද සිහි කර ඇත. බැතිමතුන්ගේ මාලාව, රුද්‍රාගේ මාලාව, සහ දැනුමේ මාලාව යන සියල්ල වෙනස්ය. බැතිමතුන්ගේ මාලාව කිසිදා වන්දනීයත්වයට ලක් වන්නේ නැත. රුද්‍රාගේ මාලාව වැඳුම් ලබයි. ඉහළින්ම තිබෙන්නේ මලය (ටසලය), ඉන්පසුව ද්විත්ව පබුළුද ඉනප්සුව රාජකීය සිහසුනේ අසුන්ගන්නා දරුවන්ද සිටියි. රුන්ඩාගේ මාලාව, විෂ්ණුගේ මාලාවයි. බැතිමතුන්ගේ මාලාවට, ප්‍රශංසා කිරීම පමණයි කෙරෙන්නේ. ඔවුන් සියල්ලන්ම, රුද්‍රාගේ මාලාවේ පබුළු කරකවයි. ඔබලා බැතිමතුන් නොවෙයි, දැනුමැති ජීවාත්මයන්ය. පරම පියා පවසන්නේ මම දැනුමැති ජීවයන්ට ආදරය කරමි. පරම පියා, දැනුමේ මහා සාගරය වන අතර, ඔහු ඔය දරුවන්ට දැනුම ලබා දෙනවා. ඔබගේ මාලාව වන්දනීයත්වයට ලක්වෙයි. මාණික්‍ය අටේ වන්දනාව තිබේ ඔවුන් දැනුමැති ජීවාත්ම නිසයි, ඔවුන් වන්දනීයත්වයට ලක් වන්නේ. භාරතය, දිව්‍ය ලෝකය බවට පත් කරවන අය නිසා, මෙය නිරූපනය කිරීමට මිනිසුන් මුද්දක් සාදා එය පළඳියි. ඔවුන් ගෞරව සම්මාන සහිතව සමත් වෙන බැවින් ඔවුන්ට ප්‍රශංසා කෙරෙයි. මැද තබා ඇති, නව වැනි මැණික, ශිව බාබාය ඔවුන් එයට නව රත්න යැයි කියයි. මෙය විස්තරාත්මක පහදා දීමකි. පියා පවසන්නේ මෙපමණයි පරමාත්ම පියාව සහ ඔබගේ උරුමය සිහිපත් කරන්න, එවිට ඔබගේ පාපයන් දුරු වී, ඔබ ආපසු නිවහනට යනු ඇත. අපවිත්‍ර ජීවයන්ට, පිවිතුරු ලෝකයට යාමට නොහැක. මෙහි, සෑම කෙනෙක්ම අපවිත්‍රයි. දේවතාවන්ගේ සිරුරු, පිවිතුරු මෙන්ම පාපයන්ගෙන් තොරයි ඔවුන් වන්දනීයත්වයට සුදුසුයි. රජ සහ රැජින කෙබඳුද, පුරවැසියන්ද එසේමය. මෙහි, සියල්ලන්ම වඳින්නන්ය. එහි ශෝකය පිළිබඳ ප්‍රශ්නයක් නැත. එයට දිව්‍ය ලෝකය, සතුටේ දේශය යැයි කියයි. එහි සතුට, ධනය සහ සාමය සියල්ලම තිබුණි. දැන් කිසිවක් නැත. මෙයට අපාය යැයිද, එයට දිව්‍ය ලෝකය යැයිද කියන්නේ ඒ නිසාය. ජීවාත්ම වන අපි, සාම දේශයේ වැසියන්ය. අපි එහි සිට පැමිණෙන්නේ අපගේ චරිත කොටස් රඟපෑමටයි. අපි මුළු උපත් 84 ම ගත යුතුයි. එය දැන් ශෝකයේ දේශය වන අතර අපි ඉන්පසුව සාම දේශයටද පසුව සතුටේ දේශයටද යයි. පියා ඔබට සතුටු දේශයේ අධිපතියන් වීමට සහ මනුෂ්‍යයන්ගෙන් දේවතාවන් බවට පරිවර්ථනය වීමට දිරි ගන්වයි. මෙය, ඔබගේ සංගම යුගයයි. පරම පියා පවසන්නේ මම සෑම යුගයකම නොව, චක්‍රයේ සංගම යුගයෙදී පැමිණෙන්නෙමි. මම චක්‍රයේ එක් වරක් පමණක්, සංගම යුගයෙදි පැමිණෙන්නේ ලෝකය පරිවර්ථනය කිරීමටයි. එය ස්වර්ණමය යුගය වූ අතර එය දැන් කලි යුගය වන අතර ඉන්පසුව ස්වර්ණමය යුගය පැමිණිය යුතුයි. මෙය හිතකාමී සංගම යුගයයි. සෑම කෙනෙකුටම යහපතක් සිදුවිය යුතුයි. සෑම කෙනෙක්ම රාවනගේ සිරගෙයින් නිදහස් වෙයි. ඔහුට දුක නැති කරන්නා සහ සතුට පිරිනමන්නා යැයි කියයි. මෙහි සෑම කෙනෙක්ම

සිටින්නේ දුකින්ය. ඔබ උත්සාහ දරන්නේ සතුටු දේශයට යාමටයි. සතුටෙහි දේශයට යාම සඳහා, ඔබ පළමුව සාම දේශයට යා යුතුයි. ඔබගේ චරිත කොටස් රඟපෑම ආරම්භ කර දැනට වසර 5000 කි. පියා විස්තර කරන්නේ ඔබගේ නිවහනින් පිටත් වී දැනට වසර 5000 කි එමෙන්ම එම කාලය තුළදී භාරතයේ ඔය ජනතාව උපත් 84 ක් ගෙන ඇත. එය දැන් ඔබගේ අවසන් උපතයි එය සෑම කෙනෙකුගේම විශ්‍රාමික ස්ථිතියයි. සෑම කෙනෙක්ම ආපසු ගෙදර යා යුතුයි. ඔහු දැනුමේ මහා සාගරය, රුද්‍රා බව සිහි කෙරෙයි. මෙය ශිවාගේ දැනුමේ යාග හෝමයයි. ශිවා, පාරිශුද්ධකරුයි තවද ඔහු උත්තරීතර ජීවාත්මයයි. බැතිමතුන් ඔහුට රුද්‍රා යන නම දී ඇත. ඔහුගේ සැබෑ නම, ශිවා පමණයි. ශිව බාබා, බ්‍රහ්මගේ මාර්ගයෙන් ස්ථාපනය සිදුකරයි. සිටින්නේ එක් බ්‍රහ්ම කෙනෙක් පමණයි. මෙම කෙනා අපවිත්‍රයි, පසුව මෙම බ්‍රහ්මම පිවිතුරු වෙයි, එබැවින් ඔහු සුරංගනාවක් වෙයි. සූක්ෂම දේශයේ පෙන්වා ඇති බ්‍රහ්ම වෙනත් බ්‍රහ්ම කෙනෙක් නොවෙයි. එක් බ්‍රහ්ම කෙනෙක් පමණයි සිටින්නේ. ශාරීරික කෙනා මෙම කෙනා වන අතර එම කෙනා සූක්ෂම කෙනාය. මෙම කෙනා සම්පූර්ණයෙන්ම පිවිතුරු වූ විට, ඔහුව සූක්ෂම දේශයේ පෙනෙයි. එහි ඇට, මස් නැත. ශිව බාබා විස්තර කර ඇත්තේ ශරීර නොමැති ජීවාත්ම, දිගින් දිගටම අවට සැරිසරයි ඔවුන්ට අවතාර යැයි කියයි. ඔවුන්ට සිරුරක් ලැබෙන තුරු ඔවුන් අවට සැරිසරයි. ඔවුන්ගෙන් ඇතමෙක් හොඳ වන අතර ඇතමෙක් නරකයි. පියා ඔබට සෑම දෙයක්ම විස්තර කරයි. ඔහු දැනුමේ මහා සාගරයයි, එබැවින් ඔහු නිසැකයෙන්ම දැනුම පහදා දෙයි. තත්පරයකදී ජීවන-මුක්තිය තිබේ. ඇල්ෆා සහ බීටා සිහි කරන්න, එවිට ඔබට තත්පරයකදී ජීවන-මුක්තිය ලැබෙයි. එය ඉතා පහසුයි! එහි නාමයම වන්නේ පහසු රාජ යෝගාවයි. ඔවුන් සිතන්නේ ඔවුන්ගේ යෝගාව භාරතයේ යෝගාව කියාය. කෙසේවෙතත්, එය, සන්‍යාසීන්ගේ හතයෝගාවයි. යෝගාව මුළුමනින්ම පහසුයි. යෝගාව යනු සිහි කිරීමයි. ඔවුන්ගේ එය, හත යෝගාවයි. මෙය පහසුයි. පරම පියා පවසන්නේ මේ අන්දමින් මාව සිහි කරන්න. ඔබගේ ගෙල වටා තැල්ලක් (ලොකට්ටුවක්) ආදිය පැළඳීමට අවශ්‍ය නැත. ඔබලා පරමාත්ම පියාගේ දරුවන්ය. සරළව පියා සිහි කරන්න! ඔබ මෙහි පැමිණියේ ඔබගේ චරිත කොටස් රඟපෑමටයි. දැන් ඔබ සියලු දෙනාම ආපසු නිවසට යා යුතු අතර ඉන්පසුව ඔබ නැවතත් එම චරිත කොටස්ම රඟපෑමට පැමිණෙයි. සූර්ය පෙළපත, ඉන්පසුව චන්ද්‍ර පෙළපත, පසුව වෛශ්‍ය පෙළපත සහ ඉන්පසුව ශුද්‍ර පෙළපත බවට පත් වන්නේ භාරතයේ ජනතාවයි. මේ කාලයේදී වෙනත් ආගම් වලට අයත් අයද පැමිණෙයි. ඉතිරි සියලු දෙනාම සාම දේශයේ සිටියි. වෙනත් ආගම් වල රජ පෙළපතක් නැත. රජ පෙළපත් තිබෙන්නේ භාරතයේ පමණයි. ඔබ සූර්ය සහ චන්ද්‍ර රජ පෙළපත් වල කොටස් බවට පත් වෙයි. ඔබ දැන් සිටින්නේ බ්‍රහ්මණ වංශයේය. ඔබ බ්‍රහ්මගේ වංශයට අයත් වන බ්‍රහ්මණයින් බවට පත් වී ඇත. පියා මෙතැන අසුන් ගෙන මේ සියලුම දේ පහදා දෙයි. තම බුද්ධියට කිසි දෙයක් ධාරණය කර ගැනීමට නොහැකි අයට, බාබාව සිහි කිරීමට යැයි කියයි. තම පියාව හඳුනාගැනීමෙන්, තම දේපළ කුමක් වෙයිද කියා, පුත්‍රයාගේ අවධානයට ඇතුළු වෙයි. දියණියකට උරුමයක් ලැබෙන්නේ නැත. මෙහි, ඔබ සෑම කෙනෙක්ම ශිව බාබාගේ දරුවන් බැවින් ඔබ සෑම කෙනෙකුටම අයිතියක් තිබේ. ඔබ සියලුම ස්ත්‍රීන් සහ පිරිමින්ට අයිතියක් තිබේ. ශිව බාබාව සිහි කරන ආකාරය, සෑම කෙනෙකුටම කියා දෙන්න. ඔබ ඔහුව වැඩියෙන් සිහිපත් කරන තරමට ඔබගේ පාපයන් වැඩියෙන් දුරුවී, ඔබ අපවිත්‍ර බවින් වැඩියෙන් පිවිතුරු වෙයි. ජීවාත්මයේ ඇති මිශ්‍ර ලෝහ ඉවත් කරගන්නේ කෙසේද? පියා පවසන්නේ යෝගාව තුළින් පමණයි, මිශ්‍ර වී ඇති ලෝහ ඉවත් වන්නේ. මෙම අපවිත්‍ර සිරුර මෙහිදී හළා දැමිය යුතුයි. ඉන්පසුව ජීවාත්මය පිවිතුරු වෙයි. ඔබ සියලු දෙනාම මදුරු රෑනක් මෙන් ආපසු යයි. ස්වර්ණමය යුගයේ ඉතා සුළු පිරිසක් පමණක් සිටිවි කියා බුද්ධිය පවසයි. මෙම විනාශයේදී බොහෝ මිනිසුන් මිය යයි. ඉන්පසුව ටික දෙනෙක් පමණක් ඉතිරි වෙයි රජවරුන් ටික දෙනෙක් සහ පුරවැසියන් 900,000 ස්වර්ණමය යුගයේ සිටියි. මේ පිළිබඳව ඔවුන් ගීයක් ගයයි - තාරකා 900,000 ක් ඇත, එනම්, පුරවැසියන්. වෘක්ෂය ආරම්භයේදී කුඩා වන අතර ඉන්පසුව එය වැඩෙයි. දැන් බොහෝ ජීවාත්ම සිටියි! පරමාත්ම පියා පැමිණ සෑම කෙනෙකුගේම මාර්ගෝපදේශකයා වී, ඔබ සියලු දෙනාවම ආපසු රැගෙන යයි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වූණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. යෝගා ගින්නේ, පාප ක්‍රියාවන්ගේ මිශ්‍ර ලෝහ පුළුස්සා දමා, පිවතුරු වන්න. එය දැන් ඔබගේ විශ්‍රාමික ස්ථිතියයි. එබැවින් ආපසු නිවසට යාම සඳහා, සම්පූර්ණයෙන්ම සතෝප්‍රධාන් වන්න.

2. මෙම හිතකාමී යුගයෙදී, පියා හා සමානව, දුක නැති කරන්නෙක් සහ සතුට පිරිනමන්නෙක් වන්න.

**වරදානය:** ඔබ ද්විත්ව ආලෝකයක් වී ඔබගේ ඒකාබද්ධ ස්වරූපය පිළිබඳව නිරන්තර අවධානයෙන් සිටීමෙන් ඕනෑම දුෂ්කර කාර්යයක් පහසුවෙන් කරත්වා.
නිරන්තරයෙන් ස්මරණයෙ රැඳී සිටින දරුවන් පරමාත්ම පියාගෙ සමාගමය (ඇසුර) අත්විඳිති. ඕනෑම ගැටළුවක් ඔවුන් ඉදිරියට පැමිණෙන විට, ඔවුන් තමන් ඒකාබද්ධ වී ඇති බව අත්විඳින අතර බියට පත් නොවේ. ඒකාබද්ධ ස්වරූපය පිළිබඳ මෙම අවධානය ඕනෑම දුෂ්කර කාර්යයක් පහසු කරයි. ඕනෑම විශාල සිදුවීමක් ඔබ ඉදිරියට පැමිණෙන විට, ඔබේ බර පියාට භාර දී ද්විත්ව ආලෝකයක් වන්න. එවිට ඔබේ මනස දේවදූතයෙකුගේ මෙන් දිවා රෑ සතුටින් නටමින් සිටිනු ඇත.

**පාඨය:** සෑම දෙයකටම විසඳුමක් සොයාගෙන තමන්වත් තෘප්තිමත්ව තබාගෙන අන් අයවත් තෘප්තිමත් කරවන අය තෘප්තියේ මැණික් වේ.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: ඔබේ ශ්‍රද්ධා විශ්වාසයෙ අත්තිවාරම ශක්තිමත් කර නිරන්තරයෙන් නිර්භීතව හා බාධක වලින් නිදහස්ව සිටින්න.**

ඔබේ සෑම පියවරක්ම ශ්‍රීමත් අනුව වන විට, ඔබ නිරන්තරයෙන් බාධක වලින් නිදහස්ව සිටින අතර, බාධක වලින් මිදුණු විට ඔබ නිවැරදි තීරණ ගනු ඇත. ඔබේ තීරණ නිවැරදි වූ විට ඔබ ජයග්‍රාහී වේ. ත්‍රිකාලදර්ශී ජීවාත්මයක් නිරන්තරයෙන් බාධක වලින් නිදහස්ව සිටින්නේ එවැනි ජීවාත්මයකට ඔහුගේ ජයග්‍රහණය දැනටමත් ඉටු වී ඇති බවට විශ්වාසයක් ඇති බැවිනි.